දුරකථන ) 011 2669192 , 011 2675011
தொலைபேசி ) 011 2698507 , 011 2694033
Telephone ) 011 2675449 , 011 2675280

ෆැක්ස් ) 011 2693866
பெக்ஸ் ) 011 2693869
Fax ) 011 2692913

විද්‍යුත් තැපෑ, ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல ) PA/EOH/FCAU/45/2016
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2018.03.19
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதாரம, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு
# Ministry of Health, Nutrition & Indigenous Medicine

---

විධාන අංක 03/2018

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,
සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු,
අධ්‍යක්ෂ, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය,
සියලුම මහ නගර සභා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්,
සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්,

<u>පාසල් ආපන ශාලා විශේෂ පරීක්ෂාවකට ලක් කිරීම.</u>

රජයේ පාසල්වල පවත්වාගන යනු ලබන ආපන ශාලා තුලින් පාසල් ළමුන් සඳහා බෙදා හරිනු ලබන අහාර පාන තත්වයෙන් බාල මෙන්ම ගුණාත්මක හා පෝෂණ තත්වයෙන් පහල මට්ටමක පවතින බව විද්‍යුත් මාධ්‍යයෙන් හා මුද්‍රිත මාධ්‍යයෙන් නිතර අසන්නට දකින්නට ලැබෙන පුවත් බවට පත්වී ඇත.
මෙම තත්වය යථාවත් කිරීම සඳහා මෙවර පාසල් නිවාඩුව අවසන් වීමට ප්‍රථම ඉදිරි සති දෙක තුල 1980 අංක 26 දරන අහාර පනතේ බලයලත් නිලධාරීන් මගින් ඔබ කොට්ටාශයේ සියළුම පාසල් ආපන ශාලා පරීක්ෂාවට ලක් කර යථාවත් කිරීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් යොදන මෙන් දන්වා සිටිමි.
අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති ආපන ශාලා ප්‍රතිපත්තිය කෙරහි අවධානය යොමුකරන ලෙසද දන්වා සිටින අතර ප්‍රධාන පාසල් හා ජාතික පාසල් වල ආපන ශාලා පරීක්ෂා කිරීමේදී දිස්ත්‍රික් අහාර හා ඖෂධ පරීක්ෂක වරයාගේ සහ දිස්ත්‍රික් පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ සේවය ලබාගන්නා ලෙසත් අහාර වලට අමතරව ඖෂධ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සිදුවන අවස්ථා වලදී අදාල නීතිමය පියවර ගැනීම විෂයපථය අයත් නිලධාරීන් මගින් සිදුකිරීමට වගබලා ගන්නා ලෙස තවදුරටත් දන්වා සිටිමි.
උක්ත කරුණ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයන් වල ප්‍රගතිය දැක්වෙන වාර්තාවක් මෙයට අමුණා ඇති ආකෘතියට අනුව සම්පූර්ණ කර දිස්ත්‍රික් මට්ටමින් 2018-04-30 දිනට ප්‍රථම මාවෙත ලැබෙන්නට සලස්වන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

..................................
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
(ප්‍රධාන ආහාර බලධරයා)

වෛද්‍ය සරත් අමුණුගම
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(මහජන සෞඛ්‍ය සේවා) I
සෞඛ්‍ය අමාත්‍යාංශය

වැ. බ. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ10.

පිටපත් :-

1. ජනාධිපති ලේකම් - දැ. පි.(අංක PS/PR/18/02/329116 ,ලිපිය හා බැදේ)
2. සෞඛ්‍ය ලේකම් පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය දැ. පි.
3. ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය දැ.පි. හා අ.ක.ස.
4. රජයේ රස පරීක්ෂක දැ.පි. හා අ.ක.ස.
5. සභාපති සමස්ත ලංකා ආපන ශාලා හිමියන්ගේ සංගමය දැ. පි.